සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| දෙවන වාර පරීක්ෂණය 2018<br>**இரண்டாம் தவணைப் பரீட்சை 2018**<br>Second Term Test 2018 | 11 ශ්‍රේණිය<br>**தரம 11**<br>Grade 11 |
| සිංහල භාෂාව හා සාහිත්‍යය 1<br>Sinhala Language And Literature 1 | පැය එකයි<br>**ஒரு மணித்தியாலம்**<br>One Hour |

**සැලකිය යුතුයි**

i. සියලුම ප්‍රශ්නවලට උත්තර ලියන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
ii. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල යෙදී ඇති (i),(ii),(iii),(iv) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ උත්තරය තෝරන්න.

01. ඔහු **ගජ බින්න** ලා කතා කළේ ය.
i. මහා ලොකු බොර ii. කෙළවරක් නැතිව iii. අංග සම්පූර්ණ ලෙස iv. ආඩම්බරව

02. එහු නිතර මේ පැත්තේ **කරක්ගහනවා** අප දැක ඇත.
i. බොහෝ අපහසුවෙන් ii. සැරිසරනවා
iii. වංචාවෙන් කාලය ගෙවනවා iv. මුදල් වංචා කරනවා

03. ගුරුතුමිය පන්තියට එන විට ළමයි **බක තපස්** රකිමින් සිටියහ.
i. ලොකු තපසක් ii. කිසිම දෙයක් නොදන්නා සේ
iii. කපටි නිහඬ කමකින් iv. කම්මැලි කුසීත කමින්

- **අංක 4 සිට 6 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පදය තෝරන්න.**

04 අසරණයන්ට .............................වීම සත්පුරුෂ ගුණයකි.
i. පිටුවහල් ii. පිටිවහල් iii. ප්‍රතිපක්ෂ iv. ප්‍රත්‍යුපකාර

05 සියලු මන්ත්‍රීවරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංගනය නොකරන බවට.........................................දී ඇත.
i. ප්‍රතඥාවක් ii. ආඥාවක් iii. යාඥාවක් iv. සංඥාවක්

06 නව විලාසිතාවන්ට හුරුවීම මෙම යුගයට පමණක්.................වූ ලක්ෂණයක් නොවේ.
i. පරිණාම ii. පරිබාහිර iii. ජනනය iv. ආවේණික

07. අකාරාදී පිළිවෙළ නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
i. අසරණ, ඉතාමත්, ඉක්මණින්, ඔත්පල ii. කාර්යාලය, කොට්ඨාසය, සිරිත්, ශිෂ්ට
iii. නිකෙලෙස්, නිවැරදි, නිසල, නිහාල් iv. අමරසේන, අමරදාස, අමරබන්දු, අමරසිරි

08. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති වරණය තෝරන්න
i. පුස්තකාලය, අබිරහස, නාම ලේඛනය, නිරාවරණය ii. මුළකුර, ආභරණ, ශිෂ්‍යාචාරය, ව්‍යාකූල
iii. නිර්මාණකරණය, සුළු, කාරනය, ආචාර්‍යය iv. සමස්ථ, ප්‍රශ්න, ශීතකරණ, වැළකීම

09. එක් එක් පදවල පාපිල්ල, ඍකාරාංශය, ඉස්පිල්ල, හා ඇලපිල්ල පිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
i. නුසුදුසු, ක්‍රෑර, මිහිරි, මාලා ii. රුවල, කෘෂි, ගිනිකිකිළි, තාරාවා
iii. කුකුළු, පාලිත, වළකින්න, රුවල iv. රුවන් ,බිහිරි, ගෘෂා, බාප්පා

10 පරපුටු යන පදය අයත් වන්නේ
i. අන්‍යාර්ථ සමාස ii. අව්‍ය සමාස iii. විභක්ති සමාස iv. ද්කාරාර්ථ සමාස

11. උක්ත පද දෙකක් හා අනුක්ත පද දෙකක් ඇතුළත් වරණය තෝරන්න.
i. නරියෙක්, දුවක්, ළමයින්, මිනිසෙක් ii. දරුවෝ, මිනිසෙකු, ගොවියා විසින්, කම්කරුවන්
iii. හාවෝ ,ළමුන්, පොළගෙක්, ගොවියන් iv. ගුරුවරුන්, සේවකයන්, අලියන්, බල්ලෝ

12 "සාකල්‍යය" යන පදයෙහි ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන්කළ විට නිවැරදිව දැක්වෙන්නේ
i. සාකල + ්‍ය ii. සකල + ය iii. සකල + ්‍ය iv. සාකල + ය

13. දරුවන්ගේ කාලය ඉතා වටින්නේය. යන වැකියෙහි"දරුවන්ගේ" යන පදය අයත් විභක්තිය වන්නේ
i. ආධාර විභක්තිය ii. සම්ප්‍රදාන විභක්තිය iii. සම්බන්ධවිභක්තිය iv. ප්‍රථමා විභක්තිය

- **අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටස්වල අර්ථය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.**

14. පෘථිවිතලයේ **ආරම්භය** කෙසේ සිදු වුණාද යන්න පිළිබඳ විද්‍යාඥයෝ විවිධ මත පළ කරති.
i. ප්‍රභවය ii. පරිණාමය iii. විකෘතිය iv. ව්‍යාප්තිය

15. සීගිරි ගී ලියූවන් අතර **විදග්ධ** කවීන් සිදු බව කියවේ.
i. විදේශීය ii. විශේෂ iii. ප්‍රසිද්ධ iv. නිපුණ

16. වෙළෙන්දෝ ආහාර පාන සුලභ **සශ්‍රීක ප්‍රදේශයකට** පැමිණියහ.
i. නගරයකට ii. කෙම්බිමකට iii. ජනපදයකට iv. වෙරළකට

17. මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න
1. සමාස - මුහුදුහුළං, සුදන, වදමල්, සවත්
2. සන්ධි - වමැස, දකුණත, ඔවුනොවුන්, ගංවතුර
3. තද්ධිත රජතමය, දැවමුවා, ධනවත්, අලුත්ම
4. කෘදන්ත නටන, ගයන, කැවුම්, ගැයෙන

18. දී ඇති වචන අතරින් අන්‍යෝන්‍ය වශයෙන් ළං වන කාර්යයන් සමග බැඳී නොපවත්නා පද පේළිය තෝරන්න.
i. ගිරවා,අලියා, මුවා, හාවා ii. මිරිස්, සුදුලූණු, කරපිංචා, සූදුරු
iii. අල්මාරිය, මේසය, ඇඳ, තුනපහ iv. සිංහයා, කොටියා, කිඹුලා, නයා

19. එක් එක් පේළියේ මුලින් දී ඇති පදයට සමානාර්ථවයක් නොදෙන පදයක් ද ඇතුළත් පද පේළිය තෝරන්න
i. ඇතා - පිනිපා,ගජ, දන්ති, නාග ii. විල - තඩාග, සරසි, සර, පත්මාකාර
iii. රජ - ක්‍ෂත්‍රිය, භූපල්, රද, නරවර iv. බුදුහිමි - ශාක්‍යසිංහ,දසබල, සෑසි, ලඹසවන්

20 විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය වන්නේ
i. තර්ක - විතර්ක ii. උත්සාහය - උදාසීන iii. අභිජාත- නිර්ජාත iv. ප්‍රවීණ -ආධුනික

21. කලල යනුවෙන් හඳුන්වනු ලබන්නේ
i. බීජය ii. කලවම iii. කාලය iv.කැරුල්ල

22. අසම්භාව්‍ය ක්‍රියා පදයක් ඇතුළත් නොවන වරණය වන්නේ
i. බල්ලන් බුරද්දී සොරු පලා ගියහ.
ii. දරුවන් පාඩම් කරන විට දෙමව්පියෝ අවදියෙන් සිටිති.
iii. ඔවුන්ට රැස්වීම ආරම්භ කළ හැකිය.
iv. ගුරුවරු ඉගැන්වුවහොත් අප විභාගය සමත් වෙමු.

23. නිවැරදි අදහස සහිත වාක්‍යය තෝරන්න.
i. සන්ධි යනු ගැළපීමයි. එසේ ගැළපෙන්නේ වචන දෙකකි
ii. ස්වරයක් වෙනුවට ව්‍යංජනයකට යොදනු ලබන සංකේත පිල්ලම් වේ
iii. "ඉෂ්ඨ" යනු උපසර්ගයකි
iv. යංශය හා රේඵය එකම අකුරක් වෙනුවෙන් යෙදෙන්නකි.

24. ආගම සන්ධිය නිවැරදිව යෙදී ඇති වරණය තෝරන්න.
i. මංමුලා ii. යක්කල iii. සැරියුත් iv.වඩුවා

25. දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන පදයෙහි අක්ෂර නිවැරදි පිළිතුර තෝරන්න.
i. ශ්වයාර ii. ඔන්ටරඔන් iii. මැමීසාඉස් iv.බාරඉබ්

- **අංක 26 , 27 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ සහිත වරණය තෝරන්න.**

26. හැම දෙයක්ම කිරීමට එකම දෙයක් යොදා ගැනීම.
i. කොටිය ආව දා කවුරුත් නෑ ii. කළ දුටු කල වළ ඉහගන්
iii. බැරි සිල් නොගන් අබරෝ iv. ගමරාළගෙ වංගෙඩිය වගේ

27. බාහිර පෙනුමෙන් වුවද මිනිසෙකු ගැන කිව හැකිය.
i. තම්බිගෙ හැටි තොප්පියෙන් දැනේ ii. සංඝරාජ වුනත් ගම තුන්පනේ
iii. පොට්ට සල්ලිය පිනට දුන්නා වගෙයි iv. කොල්ලැව නැති ඔරුව වගෙයි

28. පහත (අ) හා (ආ) යටතේ දැක්වෙන යෙදුම් වඩාත් නිවැරදි ලෙස එකිනෙකට ගැලපෙන වරණය තෝරන්න.

| (අ) | (ආ) |
|---|---|
| A - ස්වර සන්ධිය | E - රෝග |
| B - අන්‍යාර්ථ සමාසය | F - අනගිතම |
| C - සම්ප්‍රදාන විභක්ති | G - දැමිදුරු |
| D - තද්ධිත නාමයකි | H - ගුරුතුමා |

i. AH ii. BG iii. DE iv.CH

- **අංක 29 , 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.**

29. i. දරුවෝ පාඩම් කරනු ඇත. ii. දියණි තොමෝ ශිල්ප උගනිති.
iii. කවරෙක් අපට උදව් කරත්ද? iv. සිංහලයන් බෞද්ධයෝ ලු.

30. i. සිසු කැල ප්‍රීති ඝෝෂා නද දෙයි ii. සමහරෙක් බොරු ප්‍රචාර කරයි.
iii. පන්තියේ ගැහැනු ළමයි පැමිණ ඇත. iv. මා දිනුවොත් රට සංවර්ධනය කරමි.

31. පහත A, B, C, D වාක්‍යය සඳහා වඩාත් ගැළපෙන නිපාත පද අනු පිළිවෙළ තෝරන්න.

A - සිරිපාල........................මම හෙට ගමට යමි. E - පිළිබඳ
B - මව්....................දරුවන් පෝෂණය කරයි F - තොමෝ
C - දේශනය.........................විද්වත් පිරිසක් සහභාගි වූහ. G - සඳහා
D - නව ව්‍යවස්ථාව.....................ජනයා දැනුවත් ය. H - හෝ

i. GFEH ii. FGEH iii. HFGE iv.EGHF

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වරණය කුමක් ද?
අම්මා ගමට ගියා
i. අම්මා ගමට ගියෝ ය. ii. අම්මා ගමට ගියා ය.
iii. අම්මා ගමට යති iv. අම්මා ගමට යන්නෙහු

33. විලියම් ශේක්ස්පියර්ගේ තුන්වන අවදියේ ලියවුණු කෘතියක් නොවන්නේ
i. හැම්ලට් ii. ඔතෙලෝ iii. කිංග් ලියර් iv.පාර්ලිමේන්තුව

34. රූපකයක් සහිත කවි පදය තෝරන්න.
i. මිහ'ඹ මුව මඬල මෙන් දිලෙන හැම විට ii. ගණේ මිණි බැබළි කිරණෙව් සතපාය
iii. දිසෙයි වෙහෙර එහි සුර විමනක් ලෙසට iv. රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙල දීදී විදුලිය පබා

35. "පුප්ඵාධාන" යනු
i. බෝධියේ කොටසකි ii. චෛත්‍යයේ කොටසකි iii. පිළිමයේ කොටසකි iv.මලක කොටසකි

36. පහත කවියේ දී ඇති වරණ අතුරින් තෙවැනි පදය තෝරන්න.

මා ගත් වෙහෙසට ආදරයෙන්
දිය උල්පත පාදන පුංචි පුතුන්
.........................................................................
ඔබසිහි වන විට පුංචි පුතුන්

i. දෑසේ කඳුලැලි පිසදා බලනෙමි. ii. හෙට හිරු එළියට වඩින දිනේ
iii. ඒ ගත වෙහෙසම සතුටක් වෙයි මට iv. අඩසඳ මෝරන මැදියම් අහසින්

37.

දේසේ සිට ආ සතුරු මහල්ලා
දියට යන්ට ලබු ගෙඩියක් ඉල්ලා
තඹරාවිට වෙද රාළගෙ බල්ලා
කාපිලු දරුවගෙ කකුලම අල්ලා

මෙම ගීත කණ්ඩය ඇතුළත් ග්‍රන්ථය වන්නේ
i. වෙස්සන්තර නාට්‍යය ii. තලමල පිපිලා iii. මනමේ iv.හුණුවටයේ කතාව

38. හේන් භාෂාවේ විශාල ගස් දැවී ගිය ස්ථාන හඳුන්වන්නේ
i. ගැදැල්ල ගැම ii. කුරුලු පාළුව iii. ජාලය iv.අළුපොල

39. පහත සඳහන් පාඨයේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වරණය තෝරන්න.

පොත පත කියවීමෙන් හා අත්දැකීම් මගින් ලබා ගත යුතු බහුශ්‍රැත භාවය සාහිත්‍යකරුවෙකුට අවශ්‍ය වේ.

i. බහුශ්‍රැත භාවය ලබා ගැනීමෙන් සාහිත්‍යකරුවෙකු විය හැකි ය.

ii. පොත පත කියවීමෙන් හා අත්දැකීම් මගින් ලබන බහුශ්‍රැත භාවය සාර්ථක නිර්මාණකරුවෙකුට අවශ්‍ය වේ.

iii. බහුශ්‍රැත භාවය ලැබීමට නම් පොත්පත් කියවිය යුතු ය.

iv. අත්දැකීම් මෙන්ම පොත පත කියවීම අවශ්‍ය වන්නේ සාහිත්‍යකරුවෙකුට පමණි.

40. පහත කවියේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

අග පිපි මල් මලිගිය ලිය කැලේයා
වග බැඳ හෙන රජහස පුල් විලේයා
ළග තුරු මල් ගිලිහුණු රොනවුලේයා
මග බැස යව පළ හෙළ වැලි තෙලේයා

i. මුදුනෙහි මල් පිපී ඇති ඉද්ද මල් කැළයෙන් යුත්,රාජ හංසයන් රංචු පිටින් බසින්නා වූ, සල් පිපුණු විල්වලින් යුත්,ගස්වල සල්වලින් ගිලිහුණු මල් රේණු ගැවසීගත් පැහැදිලි සුදු වැලි තලාවේ මගට බැස යන්න

ii. මුදුනෙහි පිපුණු ඉද්දමල් කැළයෙන් යුත්, රංචු පිටින් බසින හංසයෝ,, පිපුණු මල් ඇති විල්වල අසල ඇති ගස්වල රොනින් ආකුල වූ සුදු වැලි තලාවේ බැස යන්න.

iii. මුදුනෙහි පිපුණු ඉද්ද මල් කැලෑවේ, රාජ හංසයෝ බසින්නා වූ, මල් පිපුණු විල් වලින් අසල ඇති ගස්වල රොන් වලින් අලංකාර වූ සුදු වැලි තලාංවේ බැස යන්න

iv. මුදුනෙහි පිපුණු ඉද්ද මල් කැළයෙන් යුත්, රංචු පිටින් හංසයන් බසින්නා ව විල් ඇති, අසල ඇති ගස්වල රොන්වලින් යුතු වූ පැහැදිලි සුදු වැලි තලාවේ බැස යන්න.

දෙවන වාර පරීක්ෂණය 2018

## සිංහල භාෂාව හා සාහිත්‍යය I පිළිතුරු 11 ශ්‍රේණිය

| | i | ii | ii | iv | | i | ii | ii | iv | | i | ii | ii | iv | | i | ii | ii | iv |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | X | | | | 11 | | | X | | 21 | X | | | | 31 | | | X | |
| 2 | | X | | | 12 | | X | | | 22 | | | X | | 32 | | X | | |
| 3 | | | X | | 13 | | | X | | 23 | | X | | | 33 | | | | X |
| 4 | | X | | | 14 | X | | | | 24 | | | | X | 34 | X | | | |
| 5 | X | | | | 15 | | | | X | 25 | | X | | | 35 | | X | | |
| 6 | | | | X | 16 | | | X | | 26 | | | | X | 36 | | | X | |
| 7 | X | | | | 17 | | | X | | 27 | X | | | | 37 | | X | | |
| 8 | X | | | | 18 | | | X | | 28 | | X | | | 38 | | | | X |
| 9 | | X | | | 19 | | X | | | 29 | | | X | | 39 | | X | | |
| 10 | X | | | | 20 | X | | | | 30 | | | | X | 40 | X | | | |

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය 2018 | 11 ශ්‍රේණිය
இரண்டாம் தவணைப் பரீட்சை 2018 | தரம் 11
Second Term Test 2018 | Grade 11

සිංහල භාෂාව හා සාහිත්‍යය 11 | පැය දෙකයි
Sinhala Language And Literature 11 | இரண்டு மணித்தியாலம்
Two Hour

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

1. i සිට x තෙක් ඇති සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. සිංහල අක්ෂර මාලාවෙහි ඇතුළත් වන පහත සඳහන් අක්ෂර කාණ්ඩ දෙක නම් කරන්න.
(අ) ඞ,ඤ, ණ, න, ම (ආ) ත, ථ, ද, ධ, න

ii පහත සදහන් වාක්‍යයෙහි වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
ප්‍රසිද්ධ ගායක ගායිකාවන් රැසක් සහභාගි වූ සංගීත සංදර්ශණය කලට වේලාවට ආරම්භ නොවූ හෙයින් නිම කිරීමට සිදු වූයේ අළුයම පහට පමණ ය.

iii පහත සදහන් පද දෙක විසන්ධි කොට ලියන්න.
(අ) ඇද්දල (ආ) මෙහෙසුරු

iv. පහත සදහන් පද දෙක කවර සමාසවලට අයත්දැයි නම් කරන්න.
(අ) අඹුදරු (ආ) මදපවන්

v. පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍ය දෙක කර්මකාරකයට හරවා ලියන්න.
(අ) වෛද්‍යවරු රෝගීන් සුවපත් කරති.
(ආ) ආදි ශිෂ්‍යයෝ අප පිළිගත්හ.

vi. පහත දැක්වෙන (අ) ,(ආ) යෙදුම්වල පළමු වචනය සමග දෙවන වචනයේ නොගැළපීමක් ඇත. වඩා ගැළපෙන සේ පළමු හෝ දෙවන පවචනය සකස් කර ලියන්න.
(අ) විදෙස් ප්‍රවෘත්ති (ආ) වර්ෂා කල

vii. පහත සඳහන් වාක්‍ය දෙකෙහි තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) වැව් **පිරුණොත්** කෙත්වතු සරු වේවි.
(ආ) අම්මා බෙහෙත් **බී** නින්දට ගියා ය.

viii පහත සඳහන් වාක්‍ය දෙකෙහි සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.
(අ) සොරු කැලෑවේ සැඟවී සිටිති'යි පොලීසිය සැක කරයි.
(ආ) ලේඛකයෙක් වූ ඔහු දක්ෂ ගායකයෙක්ද විය.

ix. හිසකේ රැවුල් කපන්නා හැඳින්වීමට යොදන තනි පදය කරනැවැමියා නම්
(අ) උපසම්පදා නොවූ භික්ෂුව.
(ආ) සමාන හදවතක් ඇත්තා.

x. ධීවර කර්මාන්තය හා බැඳී ඇති පහත සඳහන් පදවල අදහස ලියන්න.
(අ) මාරියාව
(ආ) ඉහත්තුව

2. පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරින් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු රචනයක් ලියන්න

(අ) සන්නිවේදන මාධ්‍යයන්ගේ වර්ධනයත් සමග මුළු ලෝකයම විශ්ව ග්‍රාමයක් බවට පත්වන ලකුණු දැන් දැන් පහළ වෙමින් පවතී. මෙහිදී රූපවාහිනිය ආදී කොටගෙන ඇති විද්‍යුත් මාධ්‍යයන්ගේ බලපෑම අති

විශාලය.ජනතාව ක තුළ දැනුම , වින්දනය හා කාර්යක්‍ෂමතාව වර්ධනය කිරීම සියලු සන්නිවේදන මාධ්‍යයන්ගේ වගකීමකි එය ජාතික කර්තව්‍යයකි.

(ආ) ළමා අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමේ වගකීමට ලොව සෑම රටක්ම බැඳී සිටියද ළමයින් මෙහෙකරු සේවයේ යෙදවීම ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල පවතින පලබල සමාජ ගැටලුවකි. ළමා ශ්‍රමිකයන් මෙවැනි විවිධ අපයෝජනවලට ලක් වීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ පුවත් නිතර වාර්තා වේ. නොයෙක් සමාජ ආර්ථික හේතු මත උද්ගත වී ඇති මේ ප්‍රශ්නය විසඳීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුව ඇත.

(ඉ) වර්තමාන ශ්‍රී ලාංකිකයන් වැඩි දෙනෙකුගේ සමීපතම රූපවාහිනී වැඩසටහන බවට පත්ව තිබෙන්නේ ටෙලි නාට්‍යයි. මේවායින් බහුතරයක් කලාත්මක බවින් හීන හරසුන් ඒවා බව විචාරකයෝ පවසති. එබැවින් ටෙලි නාට්‍ය අධ්‍යාපනික, සෞන්දර්යාත්මක හා ගුණාත්මක අරමුණු සමග සබැඳි විනෝදාස්වාදාත්මක මාධ්‍යයක් බවට පත් කිරීම කාලීන අවශ්‍යතාවකි.

(ඊ) ගැමි පරිසරය සමග බැඳුණු සිංහල සංස්කෘතිය හා සාරධර්ම ශ්‍රී ලාංකේය අනන්‍යතාව කදිමට කියාපායි සංවර්ධන ඉලක්ක කරා යාමේදී සිදුවන නාගරීකරණය නිසා මෙම උසස් ගුණාංග ක්‍රමයෙන් අභාවයට යමින් පවතී. මේවා ආරක්‍ෂා කර ගැනීමට පෙළ ගැසීම අප කාගේත් වගකීමකි.

3. පහත දැක්වෙන පාඨය වචන 55-65 අතර සංඛ්‍යාවකින් සාරාංශ කොට ලියන්න ඔබේ සාරාංයේ ඇතුළත් වචන ගණන උත්තරය අග ලියන්න

දරුවා යනු රටක ජාතික සම්පතකි. එම සම්පත රටට ඵලදායී ලෙස සකසා ගැනීමේ වලකීම දරුවාගේ මව්පියන් අත රැඳී පවතී. දරුවකුගේ පූර්ණ සංවර්ධනය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. ළමයාගේ මානසික සංවර්ධනයට බලපාන ප්‍රධාන හේතු සාධක ලෙස අධ්‍යාපනය දැක්විය හැකිය. දරුවකු අධ්‍යාපනය ලැබිම අරඹනු ලබන්නේ මවුකුස තුළදීමය. මවුකුසින් බිහි වූ දරුවකුගේ දිවියේ මුල් වසර පහ සම්පූර්ණ වන විට මොළයේ වර්ධනයෙන් සියයට 90 වක් සම්පූණ වී අවසන් ය. මොළයේ ශීඝ්‍ර වර්ධනයක් සිදුවන මුල් වසර පහ තුළ ඊට රුකුල් ලබා දීම මව්පිය වැඩිහිටි සැමගේ වගකීමකි. ඒ සඳහා අවශ්‍ය විවිධ ඉගෙනුම් අවස්ථා නිවසේ දීම සළසා දීම කළ හැකි ය.නිවස ආශ්‍රිතව කෙරෙන සෑම ක්‍රියාකාරකමක් ආශ්‍රයෙන්ම දරුවාට අධ්‍යාපනය ලබා ගැනීමේ අවස්ථාව සලසාදීමට හැකියාව තිබේ.නිවසේ කටයුතු සඳහා දරුවා හවුල් කර ගැනීම තුළින් දරුවාගේ සංවර්ධනයට අවශ්‍ය සාධක සලසාදීමට මවුපියන් ක්‍රියා කළ යුතුවේ.දරුවා නිවසින් පෙර පාසලටද පෙර පාසලින් විධිමත් අධ්‍යාපනයටද යොමු වීමේදී නිවසේදී ලබාගන්නා අත්දැකීම් හා දැනුම ඔවුන්ට උපකාරී වේ.

4. පහත දැක්වෙන කොටස කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

ලංකාවේ ගද්‍ය හා පද්‍ය සාහිත්‍ය කලාවන් අනුරාධපුර යුගයේ සිටම නිශ්චිතව දෘශ්‍යමාන වන නමුත් නාට්‍ය කලාව පිළිබඳ එවැනි තත්ත්වයක් ඇති නොවීය. එසේ වුවද විජයාවතරණයේ සිට යක් නැටුම් විශේෂයක් පැවති බවටද පණ්ඩුකාභය රජතුමා පවා නෘත්‍ය,ගීත,වාද්‍ය, මගින් ප්‍රීතිමත් වූ බවද මහාවංශයේ සදහන් වී තිබේ. පොළොන්නරු යුගයේ පැරකුම්බා රජු විසින් කරන ලදැයි පිළිගැනෙන "සරස්වතී මණ්ඩපය"ද රාජකීය නෘත්‍ය ශාලාවක් ලෙස විචාරකයෝ අදහස් කරති.අනුරාධපුර යුගයේ සිට මෙහි වැසියෝ ලෞකික ජීවිතයේ විවිධාකාර ගැටලුවලට මුහුණ දුන්හ. ඔවුන් ත්‍රිවිධ රත්නයට අමතරව විවිධ දෙවි දේවතාවුන් හා යක්‍ෂ, භූත , ප්‍රේත, වැනි ප්‍රාථමික ඇදහිලි හා පූජා විදිවල නිරත වී ඇත. මෙම ඉපැරණි පූජා විදි හා ඇදහිලිවල නාට්‍යමය ලක්‍ෂණ ඇතුළත් වී තිබිණි ලෝකයේ වෙනත් රටවල මෙන්ම ලක්දිව ද නාට්‍ය කලාවේ උපත සෙවිය යුත්තේ ලාංකික ආගමේ වන්දනාමාන,පූජෝත්සව, හා යාගහෝම ආදියෙහි යයි සිතීම යුක්ති යුක්ත බව සිංහල ගැමි නාටකය නම් කෘතිය මඟින් එදිරිවීර සරත්චන්ද්‍ර ශූරීහු පෙන්වා දෙති.

(i) මෙම ඡේදයෙන් ප්‍රකාශ කිරීමට අපේක්‍ෂා කරන ප්‍රධාන අදහස කුමක් ද?.
(ii) නාට්‍ය කලාව පිළිබඳ මහාවංශයේ සඳහන් කරුණු මොනවා ද?.
(iii) අනුරාධපුර යුගයේ වැසියන්ගේ ඇදහිලි ක්‍රම මොනවා ද?.
(iv) සරස්වතී මණ්ඩපය පිළිබඳ විචාරක මතය කුමක් ද?
(v) ලංකාවේ ගද්‍ය පද්‍ය කලාව ආරම්භ වූයේ කුමණ යුගයේ ද?.

5. "ග්‍රාමීය පෙදෙස්වල වගා නොකරන ලද ඉඩම්වල ගොවි මහතුන් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ඒවායේ බෝග වගාව සඳහා ආධාර හා උපදෙස් සපයයි"
මෙය කොළඹ 02, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ විසින් පළකළ පුවත්පත් දැන්වීමක

කොටසකි.අංක 23/4, කලවාන පාර, ගොඩකවෙල. තරුණ සංගමයේ ලේකම් සමන් විජේතුංග ඔබ යැයි සිතා කොළඹ 02, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ආධාර හා උපදෙස් ඉල්ලමින් ලිපියක් ලියන්න.

නැතහොත්

ඔබ විද්‍යාලයේ ශිෂ්‍ය නායකයන්ට නිළ ලාංඡන පැළඳවීමේ උත්සවය උත්කර්ෂවත් අයුරින් පැවැත්වීට සියලු කටයුතු සූදානම් කොට ඇත. මෙහිදී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන වැඩසටහන පිළිබඳ න්‍යාය පත්‍රයක් පිළියෙල කළ යුතුව ඇත. මෙහි සංවිධායක ඔබ යැයි සිතා උත්සවයෙහි සෑම අංගයක්ම ඇතුළත් කොට කාල කළමනාකරණය කෙරෙහිද සැලකිලිමත් වෙමින් අදාළ න්‍යාය පත්‍රය සකස් කරන්න.

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය 2018
**இரண்டாம் தவணைப் பரீட்சை 2018**
Second Term Test 2018

11 ශ්‍රේණිය
**தரம் 11**
Grade 11

සිංහල භාෂාව හා සාහිත්‍යය 111
Sinhala Language And Literature 111

පැය එකයි
**இரண்டு மணித்தியாலம்**
Two Hour

**සැලකිය යුතුයි**

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි

1. (i) සිට (x) තෙක් සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න කිසියම් අනු කොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න

(i) " සිටුපුත්හු ද සැටරියන් හුණ දණ්ඩක් බිම හිඳුවාලා හුණදඬු අගට නැංගෝ ය."
(අ) මෙම පාඨය උපුටාගනු ලැබූ මුල් ග්‍රන්ථය කුමක් ද?
(ආ) එම ග්‍රන්ථයෙහි රචකයාගේ නම කුමක් ද?

(ii) (අ) "මග විසිතුරු" පද්‍ය පන්තිය ඇතුළත් මුල් කෘතිය කුමක් ද?
(ආ) එම කෘතිය රචනා වූ යුගය ලියා දක්වන්න.

(iii) "මිනිහා අනුමානයක් නෑ මැරෙන්ඩ ඇති"
(අ) මෙය කාගේ ප්‍රකාශයක් ද?
(ආ) මෙහි "මිනිහා" යනුවෙන් හැඳින්වෙන්නේ කවරෙක් ද?

(iv) "සිනිඳු මොළොක් බව මලෙහී - පිරිසිදු බව පිනි බිඳෙහී"
(අ) මෙම කොටස උපුටාගත් පද්‍ය පන්තියෙහි නම කුමක් ද?
(ආ) මෙහි රචකයාගේ වෙනත් කෘති දෙකක නම් ලියන්න.

(v) "එමාසත්හු වෙණ නද අසමානය - සමා නොවෙති කොවුලෝ උපමානය
තමා නාද මිහිරැයි යන මානය - ......................................................................"
(අ) මෙහි ඉතිරි පදය ලියා දක්වන්න. (ආ) මෙම පද්‍යයෙහි රචකයා නම් කරන්න.

(vi) (අ) මුල්ම සිංහල සන්දේශය ලෙස සැළකෙන්නේ කිනම් සන්දේශයක් ද?
(ආ) සන්දේශ කාව්‍යයන්හි ස්වර්ණමය යුගය ලෙස සැළකෙන්නේ කිනම් යුගය ද?

(vii) "මා කී දේ දෙවියනි බොරුවක්ම නැති - බිම එළි උනොත් කණු මදු බොහොම ළඟ ඇති
ඇහැට වෙහෙස ඇත තුන් යමට නිදි නැති - ......................................................................"
(අ) ඉහත කවියෙහි අවසාන පදය ලියා දක්වන්න.
(ආ) මෙහි එන "තුන්යම" යනු කුමක් ද?

(viii)" එක් සොරෙකු බැවින් කුම් කෙරෙයි"
(අ) මෙය කාගේ ප්‍රකාශයක් ද? (ආ) ඉහත පාඨය උපුටාගත් මුල් ග්‍රන්ථය කුමක් ද?

(ix) "සිනිඳු වස්ත්‍ර මිණි අබරණ තුමුල මාලිගා - සුවඳ බොජුන් සැප සයනා මිරිවැඩි සගලා"
(අ) ඉහත කොටස ඇතුළත් නිර්මාණයෙහි රචකයා නම් කරන්න.
(ආ) "තුමුල මාලිගා" යන්නෙහි අදහස ලියා දක්වන්න.

(x) (අ) "අපටත් වැසිකිළියක්" කෙටිකතාවෙහි රචකයාගේ නම කුමක් ද?
(ආ) ඔම කෙටිකතාව උපුටා ගනු ලැබූ කෙටිති. සංග්‍රහයෙහි නම ලියන්න.

(ලකුණු 2×10=20)

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) " ගිරා පෝතකයෝ ඒ මන්ත්‍රණය අසා නිමවා උන් දෙදෙනා මන්ත්‍රණය කොට අන්තයෙහි සාල්ලෙක ලා ලා පාතට බානා කෙනෙකුන් පරිද්දෙන්...."

(අ) මේ පාඨයෙහි ඇතුළත් උපමාවක් ලියන්න.
(ආ) ඉහත පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ii)

රැති වන පෙති නැව්දින් **සුමුවෝයා**
නිති මියුරැති වෙණ **නඳ ළමුයෝයා**
සිතිවිලි නැති රූ විලස මුවෝයා
තැති නොගනිති මිනිසුන් සමුවෝයා

(අ) මෙම කවියෙන් විස්තර කර ඇති අවස්ථාව කෙටියෙන් පහදන්න.
(ආ) අංකිත පදවල අර්ථ ලියා දක්වන්න.

(iii)" ශිල්පයට උපචාර නොකරන්නා පල නොදෙයි පුත'යි කීය"

(අ) ඉහත පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.
(ආ) මෙය ශ්‍රවණය කළ තැනැත්තා ඉන් අනතුරුව සිදු කළේ කුමක් ද?

(iv)

වනසිරි පියුම් රා බඳ රණ බරණ යුරු
වටපිරි සුපුල් දුනුකේ මල් මුරුත තුරු
බිගුපිරි වැරූ ඔලු'පුලැ'ඹුල'වල තඹුරු
හිමසරි සිහිල් දිය හෙබ දැක යන් මිතුරු

(අ) පද්මරාග හා නෙළුම් සඳහා මෙම කවියෙහි යොදා ගෙන ඇති ප වචන මොනවා ද?
(ආ) මෙම කවියෙහි අවසන් පද දෙකෙහි තේරුම ලියා දක්වන්න.

(v)" තොප ගිය මැන හුන මැනව. තොප කුමකුත් නොදන්නා තැනැත්තවුන්ගෙන් මට කම් කිම් ද?"

(අ) ඉහත පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.
(ආ) මෙම පාඨය ශ්‍රවණය කළ තැනැත්තා ඉන් අනතුරුව සිදු කළේ කුමක් ද?

(ලකුණු 4×5=20)

3. i. අවස්ථා හා සිද්ධි නිරූපණයත්
ii උප යුක්ත භාෂා රීතියත්

අඟුල්මල් දමනය කතා පුවත සාර්ථක වීමට හේතු වී ඇත. අඟුල්මල් දමනය ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15)

නැතහොත්

i. ගම හා පන්සල අතර ඇති සබඳතාවත්
ii සැප සම්පත් වලින් පිරුණු ඉපැරණි ගමක ස්වභාවයත්

මැනවින් විස්තර කිරීමට හංස කවියා ගත් උත්සාහය ප්‍රසන්න වූවකි. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පහදන්න.

(ලකුණු 15)

4. i. සාහිත්‍ය කෘතියක් මෙන්ම
ii අතීත ලංකාවේ ජන ජීවිතය පිළිබඳව තොරතුරු හෙළි කරන ග්‍රන්ථයක් වශයෙන්ද

බැද්දේගම කෘතියෙහි ඇති වටිනාකම එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පහදන්න.

(ලකුණු 15)

නැතහොත්

i. ජන හදවත් තුළ දේශානුරාගය වඩවන්නටත්
ii චරිත සංවර්ධනයට නිර්මාණාත්මකව අදහස් එක් කරන්නටත්

මුනි සිරිපා සිඹිමින්නේ පැදි පෙළ මගින් එස් මහින්ද හිමියන් උත්සාහ දරා ඇත. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් ඉහත ප්‍රකාශය සනාථ කරන්න.

(ලකුණු 15)

- 5, 6, 7, ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.

5. ගුත්තිල කාව්‍ය රචනයේදී විටෙක සරල බස් වහරක් භාවිත කරන කවියා තවත් විටෙක යොදාගන්නේ කාව්‍යමය වියත් වහරකි නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක් දක්වමින් සනාථ කරන්න. (ලකුණු 10)

6. "දරුවන්ගේ සුබ සිද්ධිය වෙනුවෙන් අසීමිත ලෙස කැපවන මවකගේ චරිතයක් සුප්පා දේවියගෙන් නිරූපිතය" . සිංහබාහු නාට්‍යයේ නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක් ඇසුරින් පුපහදන්න.

(ලකුණු 10)

7. "හේන් ගොවිතැනේදී ගොවියෙකු මුහුණ දෙන අනේකවිධ දුක් කම්කටොළු කුරක්කන් හේන පැදි පෙළෙන් මැනවින් ඉස්මතුව පෙනේ."නිර්දිෂ්ට කොටසින් උදාහරණ තුනක්වත් ඇසුරින් විමසන්න.

(ලකුණු 10)

දෙවන වාර පරීක්ෂණය 2018

## සිංහල භාෂාව හා සාහිත්‍යය III පිළිතුරු 11 ශ්‍රේණිය

1. i. (අ) සද්ධර්මරත්නාවලිය (ආ) ධර්මසේන හිමි

ii. (අ) සැළලිහිණි සන්දේශය (ආ) කෝට්ටේ යුගය

iii. (අ) පුන්චිරාළලගේ/ පුන්චිරාළ වෙදරාළගේ /වෙදරාළගේ/ අලුත් ආරච්චිලගේ
(ආ) බබුන්

iv. (අ) දරු නැලවිල්ල හෙවත් ජාතික තොටිල්ල
(ආ) නිදහසේ දැහැන, නිදහසේ මන්ත්‍රණය, ලංකා මාතා

v. (අ) දමා එයින් වින්දෝ අවමානය (ආ) වැත්තෑවේ හිමි

vi. (අ) මයුර සන්දේශය (ආ) කෝට්ටේ යුගය

vii. (අ) ගොබ කළු වෙමින් කුරහන් කිරි වැද වැඩෙති
ආ) පෙරයම, මැදියම, අළුයම

viii. (අ) කොසොල් රජතුමාගේ (ආ) අමාවතුර

ix. (අ) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර
(ආ) විශාල මාළිගා/සුවිශාල මන්දිර/සුවිසල් මැදුරු

x. (අ) කේ ජයතිලක (ආ) නොනිමි සිත්තම හා තවත් කෙටිකතා

2 i. (අ) සාල්ලෙක ලා ලා පාතට බානා කෙනෙකුන් පරිද්දෙන්
(ආ) කේවට්ට බමුණා හා චූලනී බ්‍රහ්මදත්ත රජතුමා මඟුල් උයනේදී සතරකන් මන්ත්‍රණය කර නිම වූ අවස්ථාව

ii (අ) ගුත්තිල පඬිතුමාගේ වීණා නාදයේ මිහිර දසත පැතිරෙද්දී මුවන් ඊට වශීකෘතව සිටි අවස්ථාව
(ආ) **සුමුවෝයා** - සමූහ වශයෙන්
**නදළමුයෝයා** - වීණා නාදයට අරින ලද මුඛයන් ඇතිව

iii (අ) දිසාපාමොක් ආචාර්යවරයා අහිංසක කුමරුන්ට මිනිසුන් දහසක් මැරීමට කී විට අහිංසක කුමරු එය ප්‍රතික්ෂේප කළ අවස්ථාව.
(ආ) පඤ්චායුධ ගෙන ආචාර්යවරයා වැඳ සමුගෙන කළලයට ගොස් රැක සිට මිනිසුන් මැරීම

iv (අ) පියුම්රා හා තඹුරු
(ආ) මී මැස්සන් විසින් පිරිවරන ලද ඕලු, මානෙල්, එල මානෙල්, හා රතු නෙළුම් වලින් යුතු හිම හා සමාන සීතල ජලයෙන් පිරුණු ගැඹුරු ජලාශය දැක යන්න.

v (අ) උග්ගසේන සිටු පුත්‍රයාට නින්දා කරමින් විද්දත් දියණිය දරුවා නැළවූ විට සිටු පුත්‍රයා පිටව යන බව කී අවස්ථාවේදී.
(ආ) ඇගේ පැණුම් නතර කරනු පිණිස මාමණ්ඩිය වෙතගොස් තමන් ද ශිල්ප ඉගෙනීම.